**සංකල්ප පත්‍රිකාවයි.**

**භාෂා සංගම් වල නාමය සහජීවන සංගම් ලෙස වෙනස් කිරීම**

**පසුබිම**

අංක 1945 / 40 සහ 2015.12.18 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය ස්ථාපිත කරන ලදි.

උක්ත ගැසට් නිවේදනය අනුව ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යභාරයන් වනුයේ

1. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සහ ඒ හා සම්බන්ධ කටයුතු කිරීම.
2. ජාතීන් අතර සහයෝගිතාව සහ සහජීවනය ප්‍රතිෂ්ඨාපනය සඳහා අවශ්‍ය සංවාද වැඩසටහන් හඳුන්වා දී ක්‍රියාවට නැංවීම.
3. ප්‍රධාන ජාතික භාෂාවන් සහ සන්ධාන භාෂාවන් උපයෝගි කර ගනිමින් ජාතීන් අතර සංස්කෘතික, සමාජමය හා ආගමික පසුබිම අන්‍යෝන්‍යව අවබෝධ කර ගැනීමට අවශ්‍ය පහසුකම් සැපයීම.
4. උක්ත විෂයන්ට අදාළව අනුබද්ධ ආයතනයන් සමඟ විවිධ ප්‍රතිපත්ති ව්‍යාපෘති සහ වැඩසටහන් සම්පාදනය කිරීම සහ පසුවිපරම් කිරීම සහ ඇගයීම වේ.

උක්ත කාර්යභාරයන් අතරින් විවිධ ජනවාර්ගිකයන්, ආගම්, සංස්කෘතීන්, භාෂාව අතර සහ ආන්තිකරණයට ලක් වූ ජන කණ්ඩායම් අතර බිම් මට්ටමින් සුහවාදීව සංවාදාත්මක සහජීවනය ඇති කිරීමත් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමත් ප්‍රමුඛතම කාර්යභාරයන් ලෙස සැළකිය හැක.

උක්ත කාර්යභාරය ඉටු කිරීම සඳහා අමාත්‍යාංශය යටතේ පවතින අනුබද්ධ ආයතන වන රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, රාජ්‍ය භාෂා කොමිෂන් සභාව, ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය සහ රාජ්‍ය නොවන සංවිධාන මහ ලේකම් කාර්යාලය මෙන්ම අමාත්‍යාංශයේ සහජීවන අංශය සහ ප්‍රතිපත්ති සංවර්ධන අංශය විවිධ වැඩසටහන්, ව්‍යාපෘතීන් සහ ක්‍රියාකාරකම් මේ වන විට සිදු කරමින් පවති.

දැනට මෙම අමාත්‍යාංශය මඟින් ගම් මට්ටමින් භාෂා සංගම් නමින් ස්වේච්ඡා සංවිධාන 2891ක් දිවයින පුරා ලියාපදිංචි කර ඇත. උක්ත භාෂා සංගම් සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන පරිදි ස්ථාපිත කර ඇති බැවින් ජනවාර්ගික, ආගමික හා සංස්කෘතික විවිධත්වයෙන් යුතු ශ්‍රී ලාංකේය ජාතීන් අතර බිම් මට්ටමින් සහජීවනය ඇති කිරීමට සංවාද ගොඩ නැංවීමට උක්ත සංගම් උපයෝගි කර ගත හැකිය. එම භාෂා සංගම් හරහා සිංහල භාෂාව කතා කරන ජනතාවට දෙමළ භාෂාව ඉගැන්වීමත්, දෙමළ භාෂාව කතා කරන ජනතාවට සිංහල භාෂාව ඉගැන්වීමට අදාළ භාෂා පුහුණු පන්ති නොමිලයේ ලබා දීමත් සිදු කරනු ලැබේ. එසේම එම සංගම්වලට ගම් මට්ටමින් සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාළ විවිධ වැඩසටහන් , ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අමාත්‍යාංශය මඟින් මූල්‍යමය ආධාර ද ලබා දෙයි.

රටේ වර්තමාන අවශ්‍යතාව සහ වර්තමාන රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව විවිධ ජනවාර්ගිකයන් අතර සහජීවනය ඇති කිරීමෙන් ශ්‍රී ලාංකික ජාතියක් නිර්මාණය වීමට ප්‍රමුඛත්වය ලබා දීම අත්‍යාවශ්‍ය කරුණකි. සහජීවනය ඇති කිරීම මෙම අමාත්‍යාංශය වෙත පැවරී ඇති ප්‍රධානතම කාර්යභාරයක් වන බැවින් ද උක්ත භාෂා සංගම් වලට අදාළ කාර්යභාරය ඇතුළත් කර ගනිමින්

භාෂා සංගම්වල නාමය සහජීවන සංගම් ලෙස වෙනස් කිරීමෙන් ජාතික අවශ්‍යතාවයක් වන ජාතික සහජීවනය ඇති කිරීමේ කාර්යභාරය පුළුල් ලෙස ක්‍රියාත්මක කළ හැකි වේ.

**අරමුණු සහ කාර්යභාරය**

1. ජාතික සහජීවනය හා රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට ගම් මට්ටමින් ඇති විවධ රාජ්‍ය ආයතන, පෞද්ගලික ආයතන, ස්වේච්ඡා සංවිධාන,සිවිල් සංවිධාන සමඟ ඒකාබද්ධ වී අදාළ වැඩසටහන් ව්‍යාපෘති හඳුනාගෙන අමාත්‍යාංශය වෙත යොමු කර අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගෙන ක්‍රියාත්මක කිරීම.
2. සංස්කෘතික, කලාව, ආගමික උත්සව හා ක්‍රීඩා තරඟ ආදිය තුළින් ජාතීන් අතර සමගිය හා සහජීවනය ඇති කිරීමට කටයුතු කිරීම.
3. සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂාව ඉගැන්වීම සඳහා ප්‍රදේශයේ ජනතාව තුළ ප්‍රවර්ධනාත්මක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
4. ජන කොටස් අතර සහජීවනයට බාධා වන ආකාරයේ නොසන්සුන් තත්වයක් ඇති වූ අවස්ථාවක දී සමථකරුවකු ලෙස කටයුතු කිරීම සහ ඒ පිළිබඳ අදාළ රාජ්‍ය සහ සිවිල් පාර්ශවයන්ට දැනුම් දීම.
5. සමාජය තුළ නීති විරෝධී මත්ද්‍රව්‍ය සහ ආයුධ සංස්කෘතිය  පිටු දැකීම හා සමාජය තුළ එය ප්‍රවර්ධනය වීම වැළැක්වීම.
6. ජාතික සහජීවනය, රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය පිළිබඳ ප්‍රාදේශීය මට්ටමින් ප්‍රචාරය කිරීම, දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම ඇතුළුව ප්‍රචාරාත්මක ව්‍යාපාර දියත් කිරීම සහ සංවාදාත්මක වැඩසටහන් පැවැත්වීම.
7. පොදු උත්සව හා ආගමික කටයුතුවල දී භේදයකින් තොරව සහභාගී වීම හා දායකත්වය ලබා දීම.
8. අදාළ කොට්ඨාසයේ කුඩා ව්‍යවසායකයන්ට ජීවනෝපාය මාර්ග ප්‍රවර්ධනය කිරීම.
9. ආන්තිකරණයට ලක් වී ඇති ජන කොටස් හෝ පුද්ගලයින් වේ නම් එම පිරිස සමාජානුයෝජනය කිරීම හා අවැසි ශුභ සාධන පහසුකම් සැපයීම.
10. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය, පසු විපරම් කිරීම සහ ඒ පිළිබඳ අමාත්‍යාංශය වෙත වාර්තා කිරීම.
11. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය උල්ලංඝනය වන අවස්ථාවල දී අමාත්‍යාංශය නියෝගය අනුව එය නිවැරදි කිරීම සඳහා මැදිහත් වීම හා අදාළ ආයතන දැනුවත් කිරීම.

**සහජීවන සංගමයක සාමාජිකයින්**

- සහජීවනය ප්‍රවර්ධනය හා  භාෂාවන් ඉගෙන ගැනීම සඳහා උනන්දුවක් දක්වන සාමාන්‍ය ජනතාව

**සංවිධාන ව්‍යුහය**

(අ) සහජීවන සංගම් මූලික මට්ටමින් ප්‍රාදේශීය මට්ටමින්, දිස්ත්‍රික් මට්ටමින් හා ජාතික මට්ටමින් ස්ථාපිත කරනු ලැබේ. එක් සහජීවන මූලික  සංගමයක අවම සාමාජිකයින් සංඛ්‍යාව 10 දෙනෙක් වන අතර සාමාජිකත්වය ගමේ සියලුම දෙනාට ජනවර්ගය,භාෂා,ආගම්, දේශපාලන භේදයකින් තොරව විවෘත වේ. උක්ත මූලික සහජීවන සංගමයක් සඳහා වගකීම් දරණ කාරක සභාවක් පත් කර ගත යුතු වේ. එම කාරක සභාව සඳහා සභාපති, උප සභාපති, ලේකම්, උප ලේකම්,

භාණ්ඩාගාරික, උප භාණ්ඩාගාරික යන තනතුරුවලට අමතරව කාරක සභා සාමාජිකයන් 4 දෙනෙකු ද පත්කර ගත යුතු වේ.

මෙය ග්‍රාම නිලධාරී සහ සමෘද්ධි නිලධාරීගේ උපදේශකත්වයෙන් සහ ජාතික ඒකාබද්ධතා සම්බන්ධීකාරක/ සහායකයින්ගේ මඟ පෙන්වීම හා සම්බන්ධීකරණය යටතේ සිදු කළ යුතුය.

සංගමය අවම වශයෙන් මසකට වරක් රැස්විය යුතු අතර රැස්වීම් වාර්තා විධිමත් ලෙස තබා ගැනීම කළ යුතුය.

(ආ)ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් තුළ ස්ථාපිත කරන මෙබඳු මූලික සහජීවන සංගම්වල සභාපතිවරුන්ගේ සහ ලේකම්වරුන්ගේ එකතුවෙන් ප්‍රාදේශීය මහ සහජීවන සංගම් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය. එම සංගම් සඳහා ද ඉහත සඳහන් කළ තනතුරු ඇතුළත් කාරක සභාවක් පත්කර ගත යුතු අතර මෙහි උපදේශකත්වය ප්‍රාදේශීය ලේකම් සතුවනු ඇත.

(ඇ)දිස්ත්‍රික් මහ සහජීවන සංගම් පිහිටුවාගත යුත්තේ ප්‍රාදේශීය සංගම්වල සභාපතිවරුන්ගේ සහ ලේකම්වරුන්ගේ ප්‍රධානත්වයෙන් වන අතර එම සංගමය සඳහා ද ඉහත සඳහන් කළ තනතුරු ඇතුළත් කාරක සභාවක් පත්කර ගත යුතුය. මෙම දිස්ත්‍රික් මට්ටමේ සංගමයේ උපදේශකත්වය දිස්ත්‍රික් ලේකම් සතු වේ.

(ඈ)ජාතික මට්ටමේ මහ සහජීවන සංගමය සියලු දිස්ත්‍රික් සභාපතිවරුන්ගේ සහ ලේකම්වරුන්ගේ මූලිකත්වයෙන් රැස්විය යුතු අතර එහිදී ඉහත සඳහන් තනතුරු ඇතුළත් කාරක සභාවක් පත්කර ගත යුතුය. ජාතික සහජීවන සංගමයේ උපදේශකත්වය හා සම්බන්ධීකරණය ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය සිදු කළ යුතු වේ.

**සංවිධාන ව්‍යුහය**

**ජාතික මහ සහජීවන සංගමය**

| | |
|---|---|
| **උපදේශකත්වය හා සම්බන්ධීකරණය** | - ජාතික සහජීවනය,සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය |
| **සාමාජිකත්වය** | - ශ්‍රී ලංකාවේ සියලුම දිස්ත්‍රික් සහජීවන සංගම් වල සභාපතිවරුන්ගෙන් සහ ලේකම්වරුන්ගෙන් සමන්විත වන අතර එම නිලධාරීන් අතරින් කාරක සභාවක් පත් කර ගත යුතුය. |

**දිස්ත්‍රික් මහ සහජීවන සංගමය**

| | |
|---|---|
| **ප්‍රධානත්වය හා උපදේශකත්වය** | - දිස්ත්‍රික් ලේකම් |
| **සම්බන්ධීකරණය** | - ජාතික ඒකාබද්ධතා ප්‍රවර්ධන සහකාර |
| **සාමාජිකත්වය** | - ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස නියෝජනය කරන සහජීවන සංගම් සභාපතිවරුන්ගෙන් සහ ලේකම්වරුන්ගෙන් සමන්විත වන අතර එම නිලධාරීන් අතරින් කාරක සභාවක් පත් කර ගත යුතුය. |

**ප්‍රාදේශීය මහ සහජීවන සංගමය**

| | |
|---|---|
| **ප්‍රධානත්වය හා උපදේශකත්වය** - | ප්‍රාදේශීය ලේකම් |
| **සම්බන්ධීකරණය** - | ජාතික ඒකාබද්ධතා සම්බන්ධිකාරක/සහායක |
| **සාමාජිකත්වය** - | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් සියලුම සහජීවන සංගම් වල සභාපතිවරුන්ගෙන් සහ ලේකම්වරුන්ගෙන් සමන්විත වන අතර එම නිලධාරීන් අතරින් කාරක සභාවක් පත් කර ගත යුතුය. |

**මූලික සහජීවන සංගම්**

| | | |
|---|---|---|
| **ප්‍රධානත්වය හා උපදේශනය** | - | ග්‍රාම නිලධාරීන් සහ සමෘද්ධි සංවර්ධන නිලධාරීන් |
| **සම්බන්ධීකරණය** | - | ජාතික ඒකාබද්ධතා සම්බන්ධිකාරක / සහායක |
| **සාමාජිකත්වය** | - | සහජීවන සංගමයේ සභාපති, ලේකම් ඇතුළු සියලුම සහජීවන සංගමයේ නිලධාරීන් |

**සංගමයක ව්‍යුහය**

සහජීවන සංගමය 09 දෙනෙකුට වැඩි සංඛ්‍යාවකින් පිහිටුවා ගතහැකි අතර පළමු රැස්වීමේදී සභාපති,උපසභාපති,ලේකම්,උපලේකම්,භාණ්ඩාගාරික සහ කාරකසභා සාමාජිකයින් 04 දෙනෙකු පත් කර ගත යුතුය. ලබා දෙන අතුරු ව්‍යවස්ථාවට අනුව සංගමය ස්ථාපිත කළ යුතුය. පිහිටුවන සියලුම සහජීවන සංගම් ජාතික ඒකාබද්ධතා සම්බන්ධීකාරක/සහායක නිලධාරීන් විසින් අධීක්ෂණය සිදු කළ යුතු අතර එම නිලධාරීන් හරහා සංගමය ලියාපදිංචි කිරීම සඳහා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ යුතුය. භාෂා සංගම් පිහිටුවීමේ බලප්‍රදේශය ග්‍රාම නිලධාරී කොට්ඨාස බල ප්‍රදේශය විය යුතුය.